දිවි තොර කරගැනීම් පැතිර යාම යනු සැබෑ තත්වයකි. විශේෂයෙන්ම ඇතැම් දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවන් ඔස්සේ පවා, දිවි තොර කරගැනීම් සඳහා වක්‍රාකාරයෙන් අනුබල ලැබීමට හැකියාවක් තිබේ.

දිවි තොර කරගැනීම් සම්බන්ධයෙන් වන පුවත් වාර්තාවන් සමගින් උපකාරක අංක සඳහන් කිරීම යෝග්‍ය භාවිතාවක් වන්නේ ඒ හෙයිනි. දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට එය ඉවහල් විය හැක.

එසේම දිවි තොර කර ගත් ආකාරය දැක්වීම සහ දිවි තොර කර ගත් ආකාරය දීර්ඝ ලෙස විස්තර කිරීම, දිවි තොර කර ගැනීමට නැඹුරුතාවයක් ඇති අයෙකුට ඊට උත්ප්‍රේරකයක් විය හැක. දිවි තොර කර ගැනීමක් සම්බන්ධ පුවත් වාර්තාවක එවන් තොරතුරු ඇතුළත් නොකරන ලෙසින් ඒ පිළිබඳ මාධ්‍ය නිර්දේශ ඔස්සේ උපදෙස් ලබා දෙන්නේ එහෙයිනි.

හදිසි උපකාරක අංක:

*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

**#MediaEthicsSL #lka #sinhalanews #Mawbima #Aruna**